# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2017 නොවැම්බර් මස 02 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017.11.08 දින නිකුත් කරන ලදී)**


# බුද්ධිමය දේපළ (සංශෝධන)

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## බුද්ධිමය දේපළ (සංශෝධන)

එල්. ඩී. — ඕ. 37/2014.

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක  දරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2003 අංක 36 දරන පනතේ 161 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 161 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4අ) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින්, යම් භාණ්ඩ හෝ නිෂ්පාදන සම්බන්ධයෙන් ඕනෑම භූගෝලීය දර්ශකයක් නියම කරනු ලැබිය හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 010425 -475 (2017/11)